වේලනෙයි ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය.

---

1. මූල්‍ය ප්‍රකාශ

---

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

---

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව වේලනෙයි ප්‍රාදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වේලනෙයි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

---

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

(අ) වත්කම් ආදායම් හා වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 79,000 | - | - |
| අඩුවෙන් දැක්වීම් | 01 | 1,000,000 | - | - | - | - |
| අත්හැරීම් | - | - | - | - | 01 | 2,872,491 |

1.3.2 අගය නොකළ වාහන

රාජ්‍ය නොව සංවිධානයන් විසින් පරිත්‍යාග කරන ලද වාහන 31 ක් අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණ ද දැනට සභාව විසින් එම වාහන භාවිතා කරමින් පවති.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති විම

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.32,853,075 ක් වු ගනුදෙනු 06 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවු ආදායම් අතිරික්තය රු.11,763 ක් වු අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවු ආදායම අතිරික්තය රු.142,175 ක් විය.

2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබු අතර ඒ හේතුවෙන් අයවැයගත සහ තථ්‍ය ආදායම් අතර රු.518,845 ක වෙනසක් ද, අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රු.2,038,966 ක වෙනසක් ද නිරික්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 1,366 | 1,675 | - |
| බදු කුලි | 1,223 | 1,316 | 19 |
| බලපත්‍ර ගාස්තු | 114 | 337 | - |
| වෙනත් ආදායම් | 26,928 | 25,784 | 9,124 |
| | 29,631 | 29,112 | 9,143 |

### 2.3.2 උසාවි දඩ

විවිධ ආඥා පණත් යටතේ අධිකරණය විසින් 2012 වර්ෂය සඳහා අයකරන ලද රු.2,424,100 ක් වූ උසාවි දඩ ලබා ගැනිම සඳහා මෙම වාර්තාවේ දිනය තෙක් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### 2.3.3 මුද්දර ගාස්තු

2010 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු රු.5,385,278 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනිම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 උපයෝජනය නොකළ භෞතික වත්කම්

--------------------------------------------------

(i.) සංචාරකයින්ට නවාතැන් පහසුකම් සැපයීම සඳහා අත්පත් කරගන්නා ලද වටිනාකම් රු.1,000,000 ක් වූ ඉඩම මෙම වාර්තාවේ දිනය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii.) 2010 වර්ෂයේදී රු.683,400 ක පිරිවැයකින් වාර්ටි වෙරළෙහි ඉදිකරන ලද ආපන ශාලාව මෙම වාර්තාවේ දිනය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(iii.) පහත සඳහන් විෂයයන් සභාවේ ගබඩාවෙහි නිෂ්ක්‍රියව තබා තිබුණි.

| විෂයය | සංඛ්‍යාව | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| බජාජ් යතුරු පැදිය (පරිත්‍යාගයකි) | 01 | උපයෝජනය නොකෙරේ |
| පරිගනකය | 01 | අලාභහානි වී ඇත |
| ජලය බහාලුම් - ලීටර් 10 | 13 | උපයෝජනය නොකෙරේ |
| අළුත් ට්‍රැක්ටර් ටයරය | 01 | උපයෝජනය නොකෙරේ |
| ඡායා පිටපත් යන්ත්‍රය | 01 | අලාභහානි වී ඇත |
| යතුරු ලියන | 03 | අලාභහානි වී ඇත |
| විදුලි පංකා | 08 | අලාභහානි වී ඇත |
| රෝනියෝ යන්ත්‍රය | 01 | අලාභහානි වී ඇත |
| සූර්ය බල උපාංග | 01 | අලාභහානි වී ඇත |

2.4.2 ලැබිය යුතු ගිණුම්

-----------------------

2011-2012 කාලපරිච්ඡේදය තුල ගෙවන ලද එකතුව රු.1,995,420 ක් වූ අත්තිකාරම් අයකරගෙන හෝ අදාල පුද්ගලයින් විසින් පියවා හෝ නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | අත්තිකාරමට අදාල කාර්යය | මුදල |
| --- | --- | --- |
| | | රු. |
| 2011 | පොකුණ ගැඹුරට හැරීම | 165,778 |
| 2012 | ඉන්ධන අත්තිකාරම් | 4,042 |
| 2012 | වාහන අළුත්වැඩියාව | 400,000 |
| 2012 | මාර්ග වැඩ | 825,600 |
| 2012 | සූර්යබල විදුලි බල්බය | 600,000 |
| | | ------------- |
| | | 1,995,420 |
| | | ======= |

2.4.3 හිඟ කාර්ය මණ්ඩල ණය

-----------------------------------

තම තනතුරු හැර ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.124,020 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් වර්ෂ 03 සිට 10 දක්වා කාල පරාසයන් තුල හිඟ හිට තිබුණි.

2.4.4 වට්ටෝරු භාණ්ඩ ගබඩා වාර්තා පවත්වා ගැනිම

--------------------------------------------------------

(අ) අංක NP-HN 8451 දරන හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය සභාවේ වට්ටෝරු භාණ්ඩ ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

(ආ) තොග වාර්තා අනුව තාර තොගය ලීටර් 1047 ක් වූ අතර සිදුකරන ලද භෞතික හරිවැරදි බැලීම් අනුව ලීටර් 2,790 ක තොගයක් පැවතුණි.

2.4.5 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා

------------------------------------------

2012 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව විෂයයන් 17 ක ඌණතාවයක් නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විෂයය | වට්ටෝරු ලේඛනය අනුව ශේෂය | සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව තථ්‍ය ශේෂය | ඌනතාවය |
|---|---|---|---|
| පුටු | 54 | 49 | 05 |
| පුටු (ප්ලාස්ටික්) | 15 | 09 | 06 |
| නිලධාරි බෑග් | 07 | 01 | 06 |
| | 76 | 59 | 17 |

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදි පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වල විධිවිධානයන්ට අනුකූල නොවීමේ නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශිය සභා මූල්‍ය රීති | | |
| (i) | V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | ලේකම්වරයා විසින් රු.1,995,420 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | VIII පරිච්ඡේදයේ 03 වගන්තිය | - | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | XI පරිච්ඡේදයේ 206 වගන්තිය | - | වට්ටෝරු විෂයයන් සමීක්ෂණය සඳහා පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලය මාසයක් ඇතුලත සමීක්ෂණය කළ යුතු වුවද මාස 02 ක් ගතවි තිබියදි ද එය සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සහ සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i.) මු.රෙ. 396 | - | වර්ෂ 02 කට අධික කාලයක් උපලබ්ධි නොවී තිබූ වටිනාකම රු.1,350 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 571 | - | වටිනාකම රු.1,119,100 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1983 අංක 24 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පණතේ 4 වගන්තිය | - | නිලධාරින්ගෙන් අඩුකරගන්නා ලද රු.16,315 ක් වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

## 2.6 අධිකාර බලය නොලත් ඉඩම් පවරා ගැනිම්

---

සභාවේ ස්ථාවර තැන්පතු යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුලදි රු.1,000,000 වටිනා ඉඩමක් අත්පත් කරගෙන තිබුණි. කෙසේ වුවද අයවැය ලේඛනයේ මේ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

## 2.7 සූර්ය බල වීථි ලාම්පු මිළදි ගැනීමේදි අධිගෙවීම් කිරිම

---

වවුනියාවේ පුද්ගලික ආයතනයකින් එකක් රු.94,000 බැගින් රු.940,000 පිරිවැයක් දරා සූර්යබල වීථි ලාම්පු 10 ක් මිලදි ගෙන තිබුණු නමුත් ටෙන්ඩර් මණ්ඩල තීරණයකින් තොරව නල්ලූර්හි පුද්ගලික ආයතනයකින් එකක් රු.125,000 බැගින් රු.1,000,000 කට එම විෂයයම මිළදි ගෙන තිබුණු අතර මෙම ආයතනයට විදුලි භාණ්ඩ වෙනුවෙන් ව්‍යාපාර හිමිකමක්ද නොවිය. ඒ අනුව එකකට රු.31,000 බැගින් වූ මිල වෙනස නිසා රු.248,000 ක් වූ අධිගෙවීමක් සිදු වී තිබුණි.

2.8 ව්‍යාපෘති ප්‍රමාදවීම්

--------------------------

පහත දැක්වෙන පරිදි සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘති 02 ක් ක්‍රියාවට නැංවීමේ ප්‍රමාදය හේතුවෙන් විවිධ ණයහිමි ගිනුමෙහි රු.3,852,886 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

| ව්‍යාපෘති විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| කර්නි වීදිය අළුත්වැඩියා කිරිම | 2,278,822 |
| රාසයියා වීදිය අළුත්වැඩිය කිරිම | 1,574,064 |
| | ---------------- |
| | 3,852,886 |
| | ========== |

2.8.1 අත්හැර දැමූ ව්‍යාපෘති

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙහි රු.1,000,000 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කර නොතිබුණි.

| ව්‍යාපෘති විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| නමුන්ද මුනෙයි - පුන්ගුඩුතිව් | 500,000 |
| අල්ලිපිඩ්ඩි - තලයාඩි හින්දු සුසාන භූමිය | 500,000 |
| | --------------- |
| | 1,000,000 |
| | ========== |

2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------------

(අ) ළමා ආරක්ෂක කටයුතු සහ ප්‍රජාශාලා සඳහා පරිත්‍යාග වශයෙන් 2009-2012 කාලපරිච්ඡේදය තුල ලැබුණු රු.879,758 ක මුදලක් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ යහපත පිණිස යොදා නොගෙන විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා තබා තිබුණි.

(ආ) විවිධ ණයහිමි ගිණුමෙහි ශේෂය වු රු.8,085,660 මෙම වාර්තාවේ දිනය දක්වා පියවා නොතිබුණි.

(ඇ) තම තනතුරු අතහල මියගිය සහ මාරු කරන ලද නිලධාරින්ගේ නොගෙවූ වැටුප් එකතුව වූ රු.211,021 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.10 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ඝණ අපද්‍රව්‍ය බැහැරකරන ප්‍රදේශය වටා වැටක් ඉදිකිරිමේ පළමුවෙනි කොටස වශයෙන් රු.559,226 ක මුදලක් ගෙවා තිබුණි. විගණන පරික්ෂණයේදි භෞතික ප්‍රගතිය 40% ක් පමණක් බව අනාවරණය වුවද, 2012 දෙසැම්බර් 17 දින කාර්මික නිලධාරි විසින් ප්‍රමාණ පත්‍රයට අනුව වැඩ නිමකිරිමේ වාර්තාව සකස් කර තිබුණි. 187 අංක 15 දරන ප්‍රාදේශිය සභාපනතේ 03 වගන්තිය ප්‍රකාරව මහජනයාට පහසුකම් සැලසීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් රැස්කිරිම්
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) පරිත්‍යාග
(ඊ) විවිධ තැන්පතු
(උ) අයවැය ලේඛනය